**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.16 පැය 1445 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 749 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

## 01. මනුෂ්‍ය ඝාතනයක් - කරන්දෙණිය පොලිස් වසම

2025.04.15 වන දින රාත්‍රී කාලයේ කරන්දෙණිය පොලිස් වසමේ දිවියගහවෙල ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට කරන්දෙණිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ දිවියගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කලක සිට පැවති පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් සැකකරු විසින් තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට පොලිසිය විසින් සිදු කල විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කරන්දෙණිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාඋල පොලිස් ස්ථානය

2025.04.16 වන දින උදෑසන කාලයේ නාඋල පොලිස් වසමේ පිළිහුඩුගොල්ල ප්‍රදේශයේදී නාඋල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 48 ක් වන පිළිහුඩුගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාඋල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**